**කරච්චි ප්‍රාදේශීය සභාව - 2023**

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කරච්චි ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කරච්චි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු

කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉටුකළ සංවර්ධන කාර්යයන් 08ක වටිනාකම රු.32,430,993ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ අවසාන ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | වැඩ අවසන් නොවූ ඉදිකිරීම් 25කට අදාල රු.31,735,559ක ඇස්තමේන්තුගත පිරිවැය ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගෙවීම්වලට අදාල බිල්පත් ඉදිරිපත් කළ වහාම මෙම ශේෂයන් නිරවුල් කරන බව. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂවලට අදාලව සභාවට ලැබිය යුතු එකතුව රු.1,375,565ක බිම් කුලියට දීම් 50ක නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන ඇතුළු විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ලිපිගොනු ලැබූ පසුව ඒවාට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව. | ලිපි ලේඛන, ලැයිස්තු හා කාල විශ්ලේෂණ සකස්කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් වරිපනම් හා බදු අයකළයුතු දේපළ 34,250ක් සඳහා K ආකෘති පත්‍ර බෙදා හැර නොතිබුණි. | ඉදිරියේදී නැවත තක්සේරු කිරීමෙන් පසුව පූර්ණ වශයෙන් බෙදාහැරීමට පියවර ගන්නා බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | වර්ෂ 02කට වඩා පැරණි එකතුව රු.840,657ක් වූ කල් ඉකුත් වූ තැන්පතු 13ක් නිරවුල් කර නොතිබුණි. | ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.160,146,101ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 139,813,643 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 31,318,748 | 87,151,895 | 12,475,045 | 74,676,850 | 31,319,374 | 65,376,200 | 12,833,672 | 52,542,528 |
| කුලී | 161,309,534 | 78,438,208 | 66,604,905 | 11,833,303 | 50,327,930 | 69,879,051 | 59,429,615 | 10,449,436 |
| බලපත්‍ර ගාස්තු | 9,637,100 | 1,214,270 | 10,626,024 | - | 11,245,150 | 10,654,432 | 10,654,432 | - |
| වෙනත් ආදායම් | 89,670,566 | 122,292,771 | 121,264,921 | 1,027,850 | 69,992,360 | 91,881,943 | 90,072,768 | 1,809,175 |
| **එකතුව** | **291,935,948** | **289,097,144** | **210,970,895** | **87,538,003** | **162,884,814** | **237,791626** | **172,990,487** | **64,801,139** |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 05කට අධික කාලයක සිට පදිංචිකරුවන් 19,448කගෙන් අයවිය යුතු හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.60,122,001 ක් වූ අතර වර්ෂ 01ත් වර්ෂ 10ත් අතර කාලයක් පැරණි හිඟහිටි බදු, කඩකුලී හා විවිධ ගාස්තු එකතුව රු.12,106,808ක ශේෂයක්ද පැවතුණි. | ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | හිඟ ආදායම් අයකර ගැනීමට ඵලදායී පියවර ගතයුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂ එකතුව රු.2,274,784ක් පසුගිය වර්ෂ 06කට වඩා අධික කාලයක සිට නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට පියවර ගන්නා බව. | ණය මුදල නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සංවර්ධන සංචිත අරමුදලින් පසුගිය වර්ෂ 01ක සිට 03ක් දක්වා කාලයක සිට ක්‍රියාත්මක කළ එකතුව රු.31,553,960ක ගොඩනැගිලි 02ක ඉදිකිරීම් කාර්යයන් අතරමැද අත්හැරදමා තිබුණි. | ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | අදාල සංවර්ධන කාර්යයන් නියමිත කාල වකවානු තුළ අවසන් කිරිමට පියවර ගත යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 05කට අධික කාලයක සිට සභාව විසින් භාවිතා කළ වාහන 12ක් හා අක්කර 354ක විස්තීරණ වූ ඉඩම් 108ක අයිතිය මේ දක්වාම පවරාගෙන නොතිබුණි. | හිමිකාරිත්වය මාරු කිරීමට කටයුතු කරමින් පවතින බව. | සභාවට පවරා ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ 2016 වර්ෂයේදී ඉදිකළ වන්නෙරික්කුලම් සංචාරක කේන්ද්‍රස්ථානය මේ දක්වාම සංචාරකයින්ට සුදුසු පරිදි සකස් නොකිරීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු.4,790,078ක් අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | වත්කම් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | සංවර්ධන අරමුදලින් පුස්තකාල 06ක් සඳහා මිලදී ගෙන තිබූ රු.7,731,768ක්වූ අයිතම එකතුව 141ක්වූ පරිගනක පද්ධති සහ ගෘහ භාණ්ඩ අදාල අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි. | පුස්තකාලවලට ලබාදීමට පියවර ගන්නා බව. | වත්කම් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |
| (ඈ) | සභාවේ අරමුදල් සහ දේශීය ණය සංවර්ධන අරමුදලින් රු. 100,165,848ක් වැයකර ඉදිකර තිබුණු වෙළෙඳපොල කඩකාමර සංකීර්ණ 03ක්, කඩකාමර 23ක් සහ උද්‍යාන හා නැවතුම් පොලවල් ආදිය වර්ෂ 01 ක සිට 02ක් දක්වා කාලයක් නිෂ්කාර්යව පැවැතුණි. | අවස්ථා කිහිපයකදී ලංසු කැඳවන ලද නමුත් කිසිවෙකුත් ඉදිරිපත් නොවූ බව. | -එම- |
| (ඉ) | 2017 වර්ෂයේදී පමණ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ රු.4,090,488ක් වැයකර උමෛයාල්පුරම්හි ස්ථාපිත කළ කාබනික පොහොර ව්‍යාපෘතිය පසුගිය වර්ෂ 06ක කාලයක සිට අභාවිතව පැවැතුණි. | වෙනත් ස්ථානයක ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බව. | වත්කම් ප්‍රශස්ථ මට්ටමින් උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |